වෙනස් වෙමු
වෙනස් කරමු

மாறுவோம்
மாற்றுவோம்

CLEAN SRI LANKA
SOCIALLY · ENVIRONMENTALLY · ETHICALLY

# සුපිළිපන් රාජ්‍ය සේවයක් සඳහා වන "සුපිළිපන් සංස්කෘතියක් - ක්ලීන් ශ්‍රී ලංකාවක්" ජාතික මෙහෙයුම ක්‍රියාවට නැංවීමට අදාළ චක්‍රලේඛය නිකුත් කෙරේ.

ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

චක්‍රලේඛ අංකය :PS/CSL/Circular/8/2026

2026 ජූලි මස 14 වන දින

සියලුම කොමිෂන් සභා සභාපතිවරුන්
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්
සියලුම පළාත් පාලන ආයතන ප්‍රධානීන්
සියලුම රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

සුපිළිපන් රාජ්‍ය සේවයක් සඳහා වන "සුපිළිපන් සංස්කෘතියක් - ක්ලීන් ශ්‍රී ලංකාවක්" ජාතික මෙහෙයුම ක්‍රියාවට නැංවීම

ශ්‍රී ලංකාවේ සමස්ත රාජ්‍ය සේවයේම ගුණාත්මකභාවය, කාර්යක්ෂමතාව සහ පාරදෘශ්‍යභාවය ඉහළ නැංවීම මෙන්ම දූෂණයන්ගෙන් තොර ආදර්ශමත් පරිපාලන ව්‍යුහයක් ගොඩනැගීම වර්තමාන රජයේ ප්‍රමුඛතම අභිලාෂය වී ඇති අතර, මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම උදෙසා ක්‍රියාත්මක වන ක්ලීන් ශ්‍රී ලංකා ජාතික වැඩසටහන හා ඒකාබද්ධ වෙමින් රාජ්‍ය සේවයේ ආචාරධර්මීය වටිනාකම් ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය කරුණක් බවට පත්ව තිබේ.

02. පසුගිය වකවානුව තුළ රටට බලපෑ හදිසි ආපදා තත්ත්වයන් හා බලශක්ති අර්බුදය හේතුවෙන් ජාතික සුපිළිපන් සතිය සඳහා සැලසුම් කර තිබූ වැඩසටහන් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීමට අපහසු වුවද, එම අත්දැකීම් පාදක කරගනිමින් වඩාත් තීරණාත්මක, ප්‍රායෝගික සහ සමස්ත දිවයිනම ආවරණය වන පරිදි "සුපිළිපන් සංස්කෘතියක් - ක්ලීන් ශ්‍රී ලංකාවක්" උදෙසා ජාතික සුපිළිපන් සතිය - 2026 එළඹෙන **2026** ජූලි **27** වන දින සිට ජූලි **31** වන දින දක්වා ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත. මෙය හුදෙක් එක් සතියකට පමණක් සීමා වූ සැමරුම් උත්සවයක් නොව, රාජ්‍ය සේවයේ පදනම ස්ථිරසාර ලෙස වෙනස් කරන කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දීර්ඝ කාලීන වැඩපිළිවෙළක් සඳහා වන ප්‍රවේශයක් සේ සලකා කටයුතු කළ යුතුය.

03. පෞද්ගලික ලාභයන් නොතකා පොදු මහජන යහපතට නිරන්තරයෙන් ප්‍රමුඛතාවය දෙමින්, ආචාරධාර්මික වටිනාකම් සහ ප්‍රතිපත්තිමය ප්‍රමිතීන් සමඟ ඒකාබද්ධ වෙමින් කිසිවෙකු බලා නොසිටියද, කිසිදු අධීක්ෂණයකින් තොරව වුවද, තමා විසින්ම ස්වයං-පාලනයකින් යුතුව සිදු කරන නිවැරදි සහ සදාචාරාත්මක ක්‍රියාදාමයන් තුලින් ප්‍රියමනාපව සේවය සපයන සුපිළිපන්න රාජ්‍ය සේවයෙකු නිර්මාණය කිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම මෙහි මූලික අරමුණ වේ.

04. ඒ අනුව මෙම ජාතික සුපිළිපන් සතිය ක්‍රියාත්මක කිරීමේ වගකීමට සෑම රාජ්‍ය ආයතනයකම ආයතන ප්‍රධානීන් බැඳී සිටින අතර එහි ක්‍රියාකාරකම් මෙහෙයවීම එක් එක් ආයතනය තුළ පිහිටුවා ඇති අභ්‍යන්තර කටයුතු ඒකක (Internal Affairs Units - IAU) මඟින් සිදු කළ යුතුය. තවමත් එම අභ්‍යන්තර ඒකක පිහිටුවා නොමැති රාජ්‍ය ආයතනවල එය ස්ථාපිත කරන තුරු මෙම ජාතික මෙහෙයුම ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු නිලධාරීන්ගෙන් සමන්විත සුපිළිපන් කමිටුවක් (Integrity Committee) කඩිනමින් ස්ථාපිත කිරීමට අදාළ ආයතන ප්‍රධානීන් පියවර ගත යුතුය.

05. ඒ අනුව මෙම ජාතික සුපිළිපන් සතිය තුළ පහත තේමාවන් යටතේ අදාළ අමාත්‍යාංශ විසින් එක් එක් අමාත්‍යාංශ යටතේ ඇති සියලුම ආයතන සම්බන්ධ කොට ගනිමින් හඳුනාගත් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළ යුතුය.

ගාලු මුවදොර, කොළඹ 01.
காலி முகத்திடல், கொழும்பு 01.
Galle Face, Colombo 01.
දුරකථන / தொலைபேசி / Telephones: ++94 (0) 11 2354420, ++94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax: ++94 (0) 11 2446657
ඉ - තැපෑල / மின்னஞ்சல் / E-mail: prsec@presidentsoffice.lk

| දිනය | ප්‍රධාන තේමාව | සෘජුවම වගකිව යුතු අමාත්‍යාංශ, පළාත් සභා සහ කාර්යාල ව්‍යුහය |
| --- | --- | --- |
| 2026 ජූලි 27<br><br>සඳුදා | ආයතනික සුපිළිපන්භාවය ප්‍රවර්ධනය කිරීමේ දිනය<br><br>*"සුපිළිපන් නීතිගරුක රාජ්‍ය සේවයක්"* | 1. ජනාධිපති කාර්යාලය<br>2. අග්‍රාමාත්‍ය කාර්යාලය<br>3. ආරක්ෂක අමාත්‍යාංශය<br>4. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය *(සියලුම පළාත් සභා, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ද ඇතුළත්ව)*<br>5. මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය<br>6. අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය<br>7. විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය |
| 2026 ජූලි 28<br><br>අඟහරුවාදා | මූල්‍ය, ඩිජිටල්, ව්‍යවසායකත්ව හා තාක්ෂණික සුපිළිපන්භාවය ප්‍රවර්ධනය කිරීමේ දිනය<br><br>*"සුපිළිපන් ඩිජිටල් රාජ්‍ය සේවයක්"* | 1. මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය<br>2. ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය<br>3. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය<br>4. කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය<br>5. වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය |
| 2026 ජූලි 29<br><br>බදාදා<br><br>(ඇසළ පොහොය දින) | ආධ්‍යාත්මික, ආචාරධර්මීය, සංස්කෘතික සහ සමාජයීය සුපිළිපන්භාවය ප්‍රවර්ධනය කිරීමේ දිනය<br><br>*" මානව ගරුත්වයෙන් පිරි සුපිළිපන් සමාජයක්"* | 1. බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය<br>2. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය<br>3. කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය<br>4. තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය<br>5. ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය |
| 2026 ජූලි 30<br><br>බ්‍රහස්පතින් දා | මෙහෙයුම්, යටිතල පහසුකම්, සේවා සැපයීමේ සහ ශ්‍රම සුපිළිපන්භාවය ප්‍රවර්ධනය කිරීමේ දිනය<br><br>*" සුපිළිපන් පාරදෘශ්‍ය මෙහෙයුම් ජාලයක්"* | 1. ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය<br>2. නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍යාංශය<br>3. වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය<br>4. සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය<br>5. කම්කරු අමාත්‍යාංශය |
| 2026 ජූලි 31<br><br>සිකුරාදා | පාරිසරික, සම්පත් කළමනාකරණ, ග්‍රාමීය සහ ප්‍රජා සවිබලගැන්වීමේ සුපිළිපන්භාවය ප්‍රවර්ධනය කිරීමේ දිනය<br><br>*"සුපිළිපන් තිරසාර හරිත සංස්කෘතියක්"* | 1. කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය<br>2. වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය<br>3. ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය<br>4. බලශක්ති අමාත්‍යාංශය<br>5. පරිසර අමාත්‍යාංශය |

06. ඒ අනුව ඉහත දිනයන්වල තේමාවන් යටතේ ඒ ඒ අමාත්‍යාංශ සහ ඊට අදාළ සෑම රාජ්‍ය ආයතනයක්ම පහත උපදෙස් අනුව කටයුතු කළ යුතුය.

I. ජාතික සුපිළිපන් සතියේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම.

අ) මෙම ජාතික සුපිළිපන් සතියට සමගාමීව, සෑම රාජ්‍ය ආයතනයක්ම ආයතනික සුපිළිපන්භාවය තහවුරු කෙරෙන වැඩපිළිවෙළක් අනිවාර්යෙන්ම හඳුනාගත යුතුය. එහිදී දැනට අභ්‍යන්තර කටයුතු ඒකක පිහිටුවා ඇති ආයතන විසින් හඳුනා ගෙන ඇති ආයතනික සුපිළිපන් ක්‍රියාකාරකම් සැලැස්ම යටතේ වන ක්‍රියාකාරකම් සක්‍රීයව ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතු අතර අනෙකුත් රාජ්‍ය ආයතන විසින් සුපිළිපන්භාවය ප්‍රවර්ධනය අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා වන ප්‍රවර්ධන වැඩසටහන් සහ ක්‍රියාකාරකම් කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන සැලසුම් ලෙස සකස් කර ක්‍රියාත්මක කළ යුතුය.

ආ) ඉහත ක්‍රියාකාරකම් සංවිධානය කිරීමේදී සෑම රාජ්‍ය ආයතනයකම සියලුම නිලධාරීන්ගේ සහ සේවක මණ්ඩලයේ අදහස්, යෝජනා ලබාගැනීමට අනිවාර්යයෙන්ම පියවර ගත යුතුය.ඒ සඳහා ඇමුණුම් අංක 01 යටතේ දක්වා ඇති කාලරාමුව උපයෝගී කර ගත යුතුය.

ඇ) ඒ අනුව ජාතික සුපිළිපන් සතියේ සිට මෙම වර්ෂය අවසානය දක්වා වන කාලසීමාවේදි කෙටි කාලීන ක්‍රියාකාරකම් යටතේ පොදු පුරවැසියන්ගේ යහපතට ප්‍රමුඛතාවය දීම, පාරදෘශ්‍යභාවය, වගවීම, පරිපාලන බාධා අවම කිරීම, සමානාත්මතාවය සහ අපක්ෂපාතීත්වය, මූල්‍ය විනය සහ නීතියට ගරු කිරීම, ප්‍රසම්පාදන විනිවිදභාවය, ආදර්ශමත් නායකත්වය, තොරතුරු අනාවරණය කරන්නන් රැකගැනීම සහ සදාචාරාත්මක වගකීම යන වටිනාකම් උපයෝගී කොට වැඩසටහන් සහ ක්‍රියාකාරකම් හඳුනාගෙන මෙම ජාතික සුපිළිපන් සතියේදී ආරම්භ කොට ක්‍රියාත්මක කළ යුතුය.

ඈ) ජාතික සුපිළිපන් සතියේ ආරම්භක දිනය යෙදෙන ජූලි 27 වන දින පෙ.ව. 09.00 ට දිවයින පුරා පිහිටි සියලුම,අමාත්‍යාංශයකම, දෙපාර්තමේන්තු, පළාත් සභා, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සියලුම නිලධාරින් විසින් ජාතික සුපිළිපන් දිවුරුම/ප්‍රතිඥාව (ඇමුණුම් අංක 02) ආයතනික මට්ටමින් රැස්වී කියවිය යුතු අතර, එම ආදර්ශය තුළින් රාජ්‍ය සේවයේ ගෞරවය, පාරදෘශ්‍යභාවය සහ කාර්යක්ෂමතාවය රැක ගැනීමට සියලු දෙනා කැපවිය යුතුය.

ඉ) සුපිළිපන් රාජ්‍ය සේවයක් සඳහා වන "සුපිළිපන් සංස්කෘතියක් - ක්ලීන් ශ්‍රී ලංකාවක්" ජාතික මෙහෙයුම සංකේතවත් කරමින් රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් සියලුම දිස්ත්‍රික් මට්ටමින් සුපිළිපන් පාගමන් සංවිධානය කිරීම, සුපිළිපන්භාවය සහ මහජන වගකීම පිළිබඳ දැනුවත් කිරීම සම්බන්ධයෙන් ගම් මට්ටමින් ප්‍රචාරක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය හරහා සුපිළිපන්භාවය පිළිබඳ ප්‍රජා දැනුවත් කිරීම් ආදී හඳුනාගත් විශේෂ ක්‍රියාකාරකම් සිදු කිරීමට නියමිතය.

ඊ) තවද මෙම ජාතික සුපිළිපන් සතියට සමගාමීව සියලුම රාජ්‍ය ආයතන, තමන්ගේ කාර්ය මණ්ඩලයේ සහ සේවාලාභීන්ගේ නෙත ගැටෙන පරිදි ක්ලීන් ශ්‍රී ලංකා පරමාදර්ශ 10 සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන්ම ප්‍රදර්ශනය කළ යුතුය.

ඔ) ඊට අමතරව "සුපිළිපන් සංස්කෘතියක් - ක්ලීන් ශ්‍රී ලංකාවක්" ජාතික මෙහෙයුමට අදාළ බැනරය (අඩි 6x4), 2026 ජූලි 27 දින සිට සියලුම කාර්යාලවල ප්‍රදර්ශනය කිරීමට කටයුතු කළ යුතු අතර ඊට අදාළ නිර්මාණ ආකෘතිය (Design) ඇමුණුම් අංක 03 යටතේ ලබා දී ඇති සබැඳිය මඟින් භාගත කල හැකිය.

II. ජාත්‍යන්තර දූෂණ විරෝධී දින සැමරුම

තවදුරටත් මෙම වැඩසටහන් මාලාව සක්‍රීය කොට ක්‍රියාත්මක කිරීම සඳහා, එළඹෙන දෙසැම්බර් 09 දිනට යෙදෙන ජාත්‍යන්තර දූෂණ විරෝධී දින සැමරුම් දිනයේදී ඉහත අනු-අංක 06 (I) ආ යටතේ ඔබ ආයතනය විසින් හඳුනා ගන්නා ලද මධ්‍ය කාලීන, දිගු කාලීන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම හා ඉදිරියට පවත්වාගෙන යාම සිදු කළ යුතුය.

07. "සුපිළිපන් සංස්කෘතියක් - ක්ලීන් ශ්‍රී ලංකාවක්" උදෙසා සුපිළිපන් රාජ්‍ය සේවයක් සඳහා වන ජාතික මෙහෙයුම ක්‍රියාවට නැංවීමට අදාළව අභ්‍යන්තර කටයුතු ඒකක (Internal Affairs Units - IAU) මඟින් සක්‍රියව සිදු කරනු ලබන ක්‍රියාකාරකම් අතරින් විශිෂ්ටතම කාර්යසාධනයක් පෙන්නුම් කළ අභ්‍යන්තර කටයුතු ඒකක, රාජ්‍ය ආයතන, සහ නිලධාරීන් අගය කිරීම සඳහා "ජාතික සුපිළිපන් සම්මාන - 2026" සම්මාන ප්‍රදානය ජාත්‍යන්තර දූෂණ විරෝධී දිනයට සමගාමීව සිදු කිරීමට නියමිතය. ඊට අදාළ මාර්ගෝපදේශ ජාතික සුපිළිපන් සතිය තුළදී නිකුත් කරනු ලබයි.

08. "සුපිළිපන් සංස්කෘතියක් - ක්ලීන් ශ්‍රී ලංකාවක්" උදෙසා සුපිළිපන් රාජ්‍ය සේවයක් සඳහා වන ජාතික මෙහෙයුම ක්‍රියාවට නැංවීමට අදාළව ආයතන මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන සියලුම කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන වැඩසටහන් සහ ක්‍රියාකාරකම්වලට අදාළ තොරතුරු, cslintegrity@presidentsoffice.lk ඊමේල් ලිපිනය හරහා පමණක් වාර්තා කිරීමට සියලුම ආයතන ප්‍රධානීන් කටයුතු කළ යුතුය.

09. මෙම ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය මූල්‍ය අවශ්‍යතා ප්‍රථමයෙන් තමන්ගේ ආයතනික අයවැය ප්‍රතිපාදනවලින් කළමනාකරණය කර ගත යුතු අතර අත්‍යාවශ්‍ය සහ විශේෂ ක්‍රියාකාරකම් සඳහා අදාළ අමාත්‍යාංශ ලේකම්වරු සහ පළාත් ප්‍රධාන ලේකම්වරු මඟින් අතිරේක ප්‍රතිපාදන ඉල්ලුම් කළ හැකිය.

10. තවද මෙම වැඩසටහනට අදාළව අභ්‍යන්තර කටයුතු ඒකක මේ වන විට ස්ථාපිත කර නොමැති ආයතන ඉහත අනු අංක 04 යටතේ දක්වා ඇති පරිදි අදාල සුපිළිපන් කමිටුවක් ස්ථාපිත කර එහි "ප්‍රධාන සම්බන්ධීකරණ නිලධාරියා"ගේ නම, තනතුර, දුරකථන අංක සහ ඊමේල් ලිපිනය 2026 ජූලි මස 20 වන දිනට පෙර cslintegrity@presidentsoffice.lk වෙත ක්ලීන් ශ්‍රී ලංකා ලේකම් කාර්යාලය වෙත යොමු කිරීමට සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ පළාත් ප්‍රධාන ලේකම්වරුන් කටයුතු කළ යුතුය.

11. වත්මන් රජයේ ප්‍රධාන අරමුණ වන්නේ රටේ යම් යම් ආයතන හා නිලධාරීන්ගේ මුල් බැසගෙන ඇති දූෂිත මනෝභාවයන් ඉවත් කර, නිලධාරියා තුළම අභ්‍යන්තරික පරිවර්තනයක් ඇති කරමින් හුදෙක් කාර්යාලීය ලිපිගොනු මට්ටමින් පමණක් නොව ක්ෂේත්‍ර මට්ටම දක්වාම ජනතාවට දැනෙන පරිදි සුපිළිපන්භාවය සමාජගත කිරීමයි. ඒ අනුව මෙම චක්‍රලේඛය පිළිබඳ ඔබ යටතේ පවතින සියලුම ආයතන ප්‍රධානීන් දැනුවත් කර ශ්‍රී ලංකාව සුපිළිපන් දේශයක් බවට පත් කිරීමේ මෙම සුවිශේෂී ජාතික මෙහෙයුමට ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීමට කටයුතු කල යුතුය.

12. මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු විමසීම සඳහා 011 2 354 354 අමතා 2617 දිගුව සම්බන්ධ කර ගැනීමට හෝ ඊමේල් ලිපිනය - cslintegrity@presidentsoffice.lk භාවිතා කරන්න.

ආචාර්ය එන්. එස්. කුමානායක
ජනාධිපති ලේකම්

පිටපත් -

01. සියළුම පළාත් ආණ්ඩුකාරවරුන්
02. සියළුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්
03. අග්‍රාමාත්‍ය ලේකම්
04. අධ්‍යක්ෂ ජනරාල්, අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාව
05. විගණකාධිපති

ඇමුණුම 01

<u>සුපිළිපන් රාජ්‍ය සේවයක් සඳහා වන "සුපිළිපන් සංස්කෘතියක් - ක්ලීන් ශ්‍රී ලංකාවක්" ජාතික මෙහෙයුම ක්‍රියාවට නැංවීමට අදාල කාලරාමුව</u>

සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ රාජ්‍ය ආයතන විසින් මෙම ජාතික වැඩසටහනට අදාළ කාර්යයන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම පහත දක්වා ඇති නිශ්චිත දින වකවානුවලට අනුකූලව ප්‍රමාදයකින් තොරව ඉටු කිරීමට කටයුතු කළ යුතුය.

| අනු අං | ක්‍රියාකාරකම / ඉදිරිපත් කළ යුතු කෙටුම්පත් | ඉලක්කගත දිනය / අවසාන දිනය |
|---|---|---|
| 01 | අභ්‍යන්තර කටයුතු ඒකක (IAU) පිහිටුවා නොමැති ආයතනවල තාවකාලිකව ස්ථාපිත කරනු ලබන සුපිළිපන් කමිටු ස්ථාපිත කිරීම සහ සම්බන්ධීකරණ නිලධාරියාගේ තොරතුරු යොමු කිරීම. | 2026 ජූලි 20 හෝ ඊට පෙර |
| 02 | කෙටි කාලීන ක්‍රියාකාරකම් සැලසුම් ක්ලීන් ශ්‍රී ලංකා ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම. | 2026 ජූලි 24 හෝ ඊට පෙර |
| 03 | සුපිළිපන් දිවුරුම/ ප්‍රතිඥාව කියවීම (දිවයින පුරා රාජ්‍ය ආයතනවලදී). | 2026 ජූලි 27 පෙ.ව. 09.00 |
| 04 | ආයතන පරිශ්‍රය තුල ක්ලීන් ශ්‍රී ලංකා පරමාදර්ශ 10 සහ බැනරය ප්‍රදර්ශනය කිරීම. | 2026 ජූලි 27 සිට ඉදිරියට |
| 05 | හඳුනාගනු ලබන කෙටි කාලීන සුපිළිපන් ක්‍රියාකාරකම් ආරම්භ කොට ක්‍රියාත්මක කිරීම. | 2026 ජූලි 27 - දෙසැම්බර් 31 |
| 06 | සුපිලිපන් පාගමන දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කිරීම | **2026 ජූලි 28 පෙ.ව. 9.00** |
| 07 | මධ්‍ය කාලීන හා දිගු කාලීන ක්‍රියාකාරකම් සැලසුම් ක්ලීන් ශ්‍රී ලංකා ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම. | 2026 ඔක්තෝම්බර් 15 හෝ ඊට පෙර |
| 08 | අන්තර්ජාතික දූෂණ විරෝධී දින සැමරුම හා මධ්‍ය/දිගු කාලීන ක්‍රියාකාරකම් ආරම්භ කිරීම | 2026 දෙසැම්බර් 09 |
| 09 | ක්‍රියාකාරකම්වල වත්මන් තත්ත්වය සහ භෞතික ප්‍රගතිය ක්ලීන් ශ්‍රී ලංකා ලේකම් කාර්යාලය වෙත යාවත්කාලීන කිරීම. | සෑම මසකම අවසාන දිනයට පෙර |

## සුපිළිපන් දිවුරුම/ප්‍රතිඥාව - 2026

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගෞරවණීය රාජ්‍ය සේවකයෙකු වන මම,
රාජකාරියේදී, සමස්ත රාජ්‍ය සේවයේ ප්‍රගමනය වෙනුවෙන්
මා තුල වන අඩුපාඩු හා දුර්වලතා හඳුනාගෙන
ආදර්ශයෙන් වෙනස් වීමටත්,
ඒ අනුව මා අවට රාජකාරි පරිසරය හා සමාජයේ
සුපිලිපන් වෙනසක් සිදු කිරීමටත්
පෞද්ගලික ලාභ ප්‍රයෝජනවලට වඩා
සෑම විටම පොදු මහජන යහපතට ප්‍රමුඛතාවය දෙන බවටත්,
කිසිදු බාහිර අධීක්ෂණයකින් තොරව වුවද,
මාගේ හෘද සාක්ෂියට එකඟව ස්වයං-පාලනයකින් යුතුව,
සැමවිටම නිවැරදි සහ සදාචාරාත්මක දේ පමණක් සිදු කරන බවටත්,
රාජ්‍ය සේවයේ පදනම වන පාරදෘශ්‍යභාවය, වගවීම,
මූල්‍ය විනය සහ නීතියට ගරු කිරීම යන වටිනාකම්
මාගේ දෛනික රාජකාරිවලදී අනුගමනය කරන බවටත්,
රාජ්‍ය  පරිපාලන පද්ධතියෙන් අල්ලස,දූෂණය,නාස්තිය,
ලබැදියාවන් අතර ගැටුම, ඥාති සංග්‍රහය සහ ආකාර්යක්ෂමතාවය
සහමුලින්ම තුරන් කිරීම වෙනුවෙන් කැපවන බවටත්,
මා වෙත පැමිණෙන සෑම සේවාලාභියෙකුටම
කිසිදු භේදයකින් තොරව, සමානාත්මතාවයෙන් සහ
කාරුණිකව සේවය සැපයීමට මා බැඳී සිටින බවටත්,
"සුපිළිපන් සංස්කෘතියක් - ක්ලීන් ශ්‍රී ලංකාවක්" උදෙසා වන
මෙම ජාතික මෙහෙයුමට මාගේ උපරිම දායකත්වය ලබා දෙන බවටත්
මෙයින් ප්‍රතිඥා/ දිව්රුම් දෙමි!

ක්ලීන් ශ්‍රී ලංකා පරමාදර්ශ 10 සහ "සුපිළිපන් සංස්කෘතියක් - ක්ලීන් ශ්‍රී ලංකාවක්" ජාතික මෙහෙයුමේ බැනරයට අදාළ නිර්මාණ ආකෘතිය (Design) පහත සැබැදිය මඟින් භාගත කර ගත හැක.

கிளீன் ஸ்ரீ லங்கா 10 முன்மாதிரிகள் மற்றும் "நேர்மைக் கலாசாரம் - கிளீன் ஸ்ரீ லங்கா" தேசிய திட்டத்தின் பதாகைக்கான (Banner) வடிவமைப்பு மாதிரியை (Design) பின்வரும் இணைப்பின் மூலம் பதிவிறக்கம் செய்து கொள்ளலாம்."

The design format related to the banner of the 10 Clean Sri Lanka Values and the national initiative "A Culture of Integrity – A Clean Sri Lanka" can be downloaded through the link provided below.

**Link -**
**https://drive.google.com/drive/folders/1fvGL2tpBUlvUp722FekRk_NxGYhWqSE6?usp=sharing**

**QR -**